සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර පරීක්ෂණය
**மூன்றாம் தவணைப் பரீட்சை - 2026**
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: **13** | විෂයය / பாடம் / Subject: **භූගෝල විද්‍යාව** | පත්‍රය / வினாத்தாள் / Paper: **I** | පැය / மணித்தியாலம் / Hours: **3** |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. I කොටස බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වන අතර ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේම** සැපයිය යුතුය.
* **I** කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
* **II** කොටසේ ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතුය.
* **III** කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට පමණක්** පිළිතරු සැපයිය යුතුය.
* **I, II, III** කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතුය.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| | **ප්‍රශ්න අංකය** | **ලකුණු** |
|---|---|---|
| I කොටස | 1 - 40 | |
| II කොටස | 1 | |
| | 2 | |
| III කොටස | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| **එකතුව** | | |

| | **අත්සන** | **සංකේත අංකය** |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## I කොටස

එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි වරණය තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

1. ප්‍රාථමික දත්ත වන්නේ පහත දැක්වෙන ඒවා අතුරින් කවරක්ද?

(1) චන්ද්‍රිකා ප්‍රතිබිම්බයකින් ලබා ගන්නා දත්ත
(2) මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් ලබා ගන්නා දත්ත
(3) අන්තර්ජාලයෙන් ලබාගන්නා දත්ත
(4) සම්මුඛ සාකච්ඡාවකින් ලබා ගන්නා දත්ත
(5) භූලක්ෂණ සිතියමකින් ලබාගන්නා දත්ත (......)

2. ශ්‍රී ලංකාවේ කිසියම් දිස්ත්‍රික්කයක පිහිටි වාරි වැව් සංඛ්‍යාව දැක්වෙන දත්ත වර්ගය වන්නේ,

(1) ගුණාත්මක දත්ත ය. (2) විවික්ත දත්ත ය.

(3) ප්‍රාථමික දත්ත ය. (4) සන්තතික දත්ත ය.

(5) අවකාශීය නොවන දත්ත ය. (......)

3. දෙන ලද වර්ෂයක රටක අපනයන සංයුතිය නිරූපනය කිරීම සඳහා යොදාගත හැකි වඩාත් සුදුසු ප්‍රස්තාර වර්ගය නම් කරන්න.

(1) සංයුක්ත තීරු ප්‍රස්තාරය (2) සරල රේඛා ප්‍රස්තාරය

(3) අපගමන ප්‍රස්තාරය (4) සරල තීරු ප්‍රස්තාරය

(5) ද්විත්ව තීරු ප්‍රස්තාරය (......)

4. ශ්‍රී ලංකාවේ 1:50 000 භූලක්ෂණ සිතියමක 7 cm දුර ඇති මාර්ගයක සැබෑ දුර වනුයේ,

(1) 3.5 km කි (2) 3.5 cm කි (3) 14 km කි

(4) 14 cm කි (5) 21 cm කි (......)

5. 1:50 000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමක පරිමාණයකින් තොරව නිරූපණය කරනු ලබන ලක්ෂණය කුමක්ද?

(1) ප්‍රධාන ගංගාව (2) ගොඩනැගිල්ල (3) වී වගාව

(4) වැව (5) වන රක්ෂිතය (......)

6. බහුකාර්යමය වැදගත් කමක් ඇති රේඛා විශේෂය දැක්වෙන වරණය තෝරන්න.

(1) සමපීඩන රේඛා (2) සමෝෂ්ණ රේඛා (3) සමගැඹුරු රේඛා

(4) සමෝච්ච රේඛා (5) සමරේඛා (......)

7. ස්ථානයක නිරපේක්ෂ පිහිටීම නිශ්චය කිරීම සඳහා යොදා ගනු ලබන නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමයක් වන්නේ,

(1) භූගෝලීය තොරතුරු පද්ධතියයි (2) දුරස්ථ සංවේදයයි

(3) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියයි (4) දත්ත ගබඩා කරන පද්ධතියයි

(5) රේඩාර් පද්ධතියයි (......)

8. GIS හී දී දත්ත තල මත එක එක තැබීම අවශ්‍ය වන්නේ,

(1) සිතියමේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීමට ය.

(2) භූ දර්ශනයෙහි ත්‍රිමාණ ආකෘතියක් නිර්මාණය කිරීමට ය.

(3) භූගෝලීය දත්ත ගොනුවල විශාලත්වය අඩු කිරීමට ය.

(4) තත්කාලීන භූගෝලීය ලක්ෂණ ප්‍රදර්ශනය කිරීමට ය.

(5) දත්ත විචල්‍යයන්ගේ අන්තර් සම්බන්ධතාව අධ්‍යයනය කිරීමට ය. (......)

9. යම් වස්තුවක් මගින් පරාවර්තනය කරන හෝ විමෝචනය කරන ශක්තිය ග්‍රහණය කිරීම, සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම යන කාර්යයන් සිදු කරනු ලබන්නේ,

(1) භූගෝලීය තොරතුරු පද්ධතිය මඟිනි
(2) භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය මඟිනි
(3) දුරස්ථ සංවේද ක්‍රියාවලිය මඟිනි
(4) සක්‍රීය සංවේද ක්‍රියාවලිය මඟිනි
(5) අක්‍රීය සංවේද ක්‍රියාවලිය මඟිනි (......)

10. සිරස් ගුවන් ඡායාරූප ලබා ගැනීමේදී කැමරාවේ ප්‍රකාශන අක්ෂය (Optical Axis) තබාගන්නේ,

(1) පොළවට ඇලව ය.
(2) ගුවන් යානයේ දකුණු දිශාවේ ය.
(3) පොළොවට ලම්බාකාරව ය.
(4) පොළොවට ලම්බාකාර නොවන ලෙස ය.
(5) අහස දෙසට යොමුකර ය. (......)

11. උන්නතාංශය සමග උෂ්ණත්වය ක්‍රමයෙන් අඩුවන වායුගෝලීය ස්ථර දෙක දැක්වනුයේ,

(1) පරිවර්ති ගෝලය සහ අපරිවර්ති ගෝලයයි
(2) පරිවර්ති ගෝලය සහ මෙසෝ ගෝලයයි
(3) පරිවර්ති ගෝලය සහ තාප ගෝලයයි
(4) පරිවර්ති ගෝලය සහ අපරිවර්ති මණ්ඩලයයි
(5) පරිවර්ති ගෝලය සහ මෙසෝ මණ්ඩලයයි (......)


12. ග්‍රැනයිට්, වැලිගල්, හුණුගල් සහ ශිෂ්ට් යන පාෂාණ විපරිත වීමෙන් පසුව නිර්මාණය වන පාෂාණ අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ශල්ක, ක්වාට්සයිට්, කිරිගරුඬ, නයිස්
(2) වැලි, නයිස්, ජිප්සම්, ශල්ක
(3) නයිස්, ක්වාට්සයිට්, කිරිගරුඬ, ජිප්සම්
(4) නයිස්, ක්වාට්සයිට්, ශල්ක, කිරිගරුඬ
(5) නයිස්, ක්වාට්සයිට්, කිරිගරුඬ, ශල්ක (......)

13. යමහල් ක්‍රියාවලිය ඇති කරන ප්‍රධාන සාධක හතර වන්නේ,

(1) උෂ්ණත්වය, පීඩනය, විවර හා කුස්තුර, කාලය
(2) උෂ්ණත්වය, පීඩනය, ගුරුත්ව බලය, පෘථිවි භ්‍රමණය
(3) පෘථිවි භ්‍රමණය, ගුරුත්ව බලය, සංවහන ධාරා, කාලය
(4) පෘථිවි භ්‍රමණය, සංවහන ධාරා, විවර හා කුස්තර, කාලය
(5) පෘථිවි භ්‍රමණය, පෘථිවි භ්‍රමණය, සංවහන ධාරා, කාලය (......)

14. පහත A, B, C හා D අක්ෂර වලින් දක්වා ඇති ගංගා ඛාදනය ආශ්‍රිත භූ රූප පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.




(1) ගල්වන, දිය ඇල්ල, ගංමළු, දොරුව

(2) ගල්වන, දිය ඇල්ල, පිටාර තැන්න, V හැඩ නිම්නය

(3) ගල්වන, දිය ඇල්ල, පිටාර තැන්න, දොරුව

(4) ගල්වන, දිය ඇල්ල, හැඩපළු ගංගා, දොරුව

(5) ගල්වන, දිය ඇල්ල, නෙත්ති නෙරු, ගංමළු (......)

15. "මුහුදු මට්ටමේ සිට ඉහළට යන විට වායුගෝලීය පීඩනය නොකඩවා අඩුවේ." එසේ වීමට හේතුව වන්නේ,

(1) ඉහළට යන විට වායුවේ බර වැඩිවීමයි.

(2) ඉහළට යන විට වායුවේ බර අඩුවීමයි.

(3) උච්චත්වය සමඟ වායුන් සිසිල් වීමයි.

(4) උච්චත්වය සමඟ වායුවේ ඝනත්වය වැඩිවීම ය.

(5) උච්චත්වය සමඟ වායුවේ ඝනත්වය අඩුවීම ය. (......)

16. භූමි මට්ටමේ දී වාතයේ ජලවාෂ්ප ඝනීභවනය වීමෙන් නිර්මාණය වන පාවෙමින් පවතින කුඩා ජල බිංදු හඳුන්වන්නේ,

(1) ධූමිකා ලෙස ය. (2) මීදුම ලෙස ය. (3) තුහින ලෙස ය.

(4) වැස්ස ලෙස ය. (5) හිමකැට වැස්ස ලෙස ය. (......)

17. වර්ෂය පුරා ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් දක්නට ලැබෙන ජල ගැලීම්වලට හා නාය යෑම්වලට නිරන්තරයෙන් ම ගොදුරුවන දේශගුණික කලාපය වන්නේ,

(1) පහතරට තෙත් කලාපය (2) පහතරට වියළි කලාපය

(3) අර්ධ ශුෂ්ක කලාපය (4) කඳුරට තෙත් කලාපය

(5) කඳුරට වියළි කලාපය (......)

18. මීතේන් වායුව විමෝචනය කරන මානව ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ජලාශ ඉදිකිරීම සහ මුඩුබිම්

(2) ක්‍රීඩා පිටි සැකසීම සහ පාෂාණ මතුපිට

(3) වමාරා කන සතුන් ඇති කිරීම සහ කුඹුරුවල වතුර බැඳීම

(4) මහා මාර්ග තැනීම සහ තෘණ බිම්

(5) වගුරු බිම් සහ කුඹුරුවල වතුර බැඳීම (......)

19. පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මතුපිට ජලය, භූගත ජලය, වායුගෝලීය ජලය ලෙස පෘථිවිය තුළ ජලය ව්‍යාප්තව පවතී.

(2) පෘථිවි ගෝලයෙන් 71% ක්ම ජලයෙන් වැසී පවතී.

(3) ලෝකයේ තිබෙන ප්‍රධාන ගංගා ද්‍රෝණි සංඛ්‍යාව 263 කි.

(4) ගෝලීය සමස්ත ජල ප්‍රමාණයෙන් 97.5% ක් ඇත්තේ සාගරවල ලවණ ජලය වශයෙනි.

(5) පොළොවට කිඳා බැස ඇති ජලය මැග්මීය ජලය ලෙස හඳුන්වයි. (......)

20. ජල සම්පත් කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සඳහා අනුගමනය කරන 3R සංකල්පයේ අන්තර්ගතය වන්නේ,

(1) අඩු කිරීම, අරපිරිමැස්ම, නැවත භාවිතය

(2) අඩු කිරීම, යළි භාවිතය, ප්‍රතිචක්‍රීකරණය

(3) අවම කිරීම, අඩු කිරීම, භාවිතා නොකිරීම

(4) අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතා නොකිරීම

(5) දැනුවත් කිරීම, උපදෙස් පිළිපැදීම, ප්‍රතිචක්‍රීකරණය (......)

21. කෝනිෆරස් බියෝමය යනුවෙන් හඳුන්වන්නේ,

(1) ටයිගා බියෝමය

(2) කාන්තාර බියෝමය

(3) තුන්ද්‍රා බියෝමය

(4) මධ්‍යධරණී වන ළැහැබ බියෝමය

(5) සෞම්‍ය කලාපීය වනාන්තර (......)

22. සෞම්‍ය කලාපීය වනාන්තර බියෝමය හා සම්බන්ධ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න

(1) පැහැදිලි ඍතු භේදයක් දක්නට ඇත.

(2) බොහෝ ශාක පතනශීලිය. සදාහරිත ශාකද ඇත.

(3) නිවර්තන වැසි වනාන්තර වලට සාපේක්ෂව අඩු ජෛව විවිධත්වයක් දක්නට ලැබේ.

(4) යුකැලිප්ටස්, සීඩර්, ඕක්, ඔලිව්, ටියුලිප් වැනි ශාකවර්ග දක්නට ලැබේ.

(5) මි.මී. 750 – 1500 පමණ වර්ෂාපතනයක් ඇත. (......)

23. ශ්‍රී ලංකාවේ විල්ලු තෘණ භූමි පරිසර පද්ධතිය දැකගත හැකි ප්‍රදේශ දෙකක් වන්නේ,

(1) මන්නාරම, පුත්තලම.

(2) සෝමාවතිය, මනම්පිටිය

(3) පිදුරුතලාගල, බෝපත්තලාව

(4) ගල්ඔය, පොළොන්නරුව

(5) මින්නේරිය, ගිරිතලේ (......)

24. භූ විද්‍යාත්මක උපද්‍රව පමණක් අඩංගු වරණය වන්නේ,

(1) භූමිකම්පා, ජල ගැලීම්, සුනාමි, සුළි සුළං

(2) භූමිකම්පා, නායයෑම්, සුනාමි, හිමකඳු ප්‍රපතනය

(3) භූමිකම්පා, නියඟය, සුනාමි, හිමකඳු ප්‍රපතනය

(4) භූමිකම්පා, සුනාමි, නාය යෑම්, ජල ගැලීම්

(5) භූමිකම්පා, සුනාමි, නාය යෑම්, ගිනිකඳු (......)

25. වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇති ජීවීන් වෙළඳාම සම්බන්ධව කටයුතු කරන පාරිසරික සංවිධානය කුමක්ද,

(1) ස්වභාවධර්මය සංරක්ෂණය පිළිබඳ ජත්‍යන්තර සංගමය

(2) එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය

(3) එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන

(4) දකුණු ආසියාතික සහයෝගීතා පාරිසරික වැඩසටහන

(5) එක්සත් ජාතීන්ගේ කාළගුණ වෙනස්වීම පිළිබඳ රාමුගත සම්මුතිය (......)

26. මානව වර්ග, ජන වර්ග, ආගම්, භාෂා හා ආර්ථික ක්‍රියාකාරකම් අනුව ජන සංඛ්‍යාව වර්ග කර දැක්වීම,

(1) ජන සංයුතිය වේ
(2) ජන ව්‍යාප්තිය වේ
(3) ජන සංඛ්‍යා ව්‍යුහය වේ
(4) ජන ඝනත්වය වේ
(5) ජන සංඛ්‍යා විශාලත්වය වේ (......)

27. ජන සංක්‍රමණවලදී ප්‍රභව රටවලට හිමිවන ධනාත්මක ප්‍රතිඵලයක් නොවන්නේ,

(1) සංවර්ධනයට හිතකර ආකල්ප හා කුසලතා ගලා ඒම.

(2) විදේශ විනිමය උපයාගත හැකි වීම

(3) බුද්ධි ගලනය සිදුවීම

(4) සේවා වියුක්තියට ප්‍රතිකර්මයක් වීම

(5) අධිජන සංඛ්‍යා ගැටළුවට පිළියමක් වීම (......)

28. ද්වීතියික ආර්ථික ක්‍රියාකාරකමක් සහ තෘතීයික ආර්ථික ක්‍රියාකාරකමක් පිළිවෙළින් සඳහන් වන්නේ කුමන වරණයෙහිද,

(1) වෙළඳාම සහ ප්‍රවාහනය

(2) ආකර කර්මාන්තය සහ යකඩ හා වානේ කර්මාන්තය

(3) බැංකු සේවා සහ සංචාරක කර්මාන්තය

(4) කෘෂිපාදක කර්මාන්ත සහ ධීවර කර්මාන්තය

(5) රෙදිපිළි කර්මාන්තය සහ ප්‍රවාහනය (......)

29. මධ්‍යධරණී මුහුදු වෙරළ තීරයේ ජීනෝවා නගරයේ සිට වැලෙන්සියා තෙක් ඛණ්ඩිතව විහිදුණු නාගරික කලාපය හඳුන්වන නම වන්නේ,

(1) බ්ලූ බනනා
(2) ග්‍රීන් බනානා
(3) ගෝල්ඩන් බනනා
(4) යෙලෝ බනානා
(5) රෙඩ් බූවල්ලා (......)

30. හරිත විප්ලවය මගින් අවධානය යොමු කළ ප්‍රධානතම කරුණ වූයේ,

(1) කපු වගාවෙහි අස්වැන්න වර්ධනය කිරීම කෙරෙහි ය.

(2) වගා භූමි ප්‍රමාණය පුළුල් කිරීම කෙරෙහි ය.

(3) කුඩා ඉඩම් විශාල වතුවලට ඒකාබද්ධ කිරීම කෙරෙහි ය.

(4) ලෝකයේ රටවල ආහාර ගැටළුව විසඳීම කෙරෙහි ය.

(5) කාබනික පොහොර භාවිතය වර්ධනය කිරීම කෙරෙහි ය. (......)

31. කෘෂිකාර්මික තාක්ෂණය යටතේ ශ්‍රී ලංකාවේ වැඩි අවධාන යොමු නොකළ ක්ෂේත්‍රය දැක්වෙන වරණය තෝරන්න,

(1) වාරි තාක්ෂණය (2) ජාන තාක්ෂණය

(3) නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය (4) ජෛන්ද්‍රීය කෘෂිකර්මාන්තය

(5) හරිතාගාර වගාව (......)

32. ලොව ප්‍රධාන ගල් අඟුරු නිෂ්පාදන රටවල් දැක්වෙන වරණය තෝරන්න,

(1) චීනය, එක්සත් ජනපදය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව

(2) රුසියාව, කොළොම්බියාව, යුක්රේනය, ග්‍රීසිය

(3) ජර්මනිය, පෝලන්තය, කසකස්තානය, තුර්කිය

(4) චීනය, රුසියාව, ග්‍රීසිය, තුර්කිය

(5) රුසියාව, කසකස්තානය, යුක්රේනය, ග්‍රීසිය (......)

33. ඕස්ට්‍රේලියාවේ හැමර්ස්ලි වැටිය ප්‍රදේශය වඩාත් ප්‍රසිද්ධ වී ඇති ඛනිජ වර්ගය වන්නේ,

(1) ගල් අඟුරු (2) ඛනිජ තෙල් (3) යපස්

(4) රන් (5) තඹ (......)

34. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව දියත්කර ඇති ප්‍රභේද අතර, වික්‍රමයන් ආශ්‍රිත සංචරණ ප්‍රදේශයක් දැක්වෙන වරණය කුමක්ද,

(1) සිංහරාජ වනය (2) සීගිරිය (3) දඹාන වැදි ගම්මානය

(4) කිතුල්ගල ප්‍රදේශය (5) නුවරඑළිය ප්‍රදේශය (......)

35. පැසිෆික් - ආසියා සංචාරක සංගමයේ (PATA) මූලස්ථානය පිහිටි නගරය වන්නේ,

(1) හොනලුලු (2) මැඩ්රිඩ් (3) බැංකොක්

(4) නිව්යෝර්ක් (5) රියෝද ජැනයිරෝ (......)

36. ගෝලීයකරණයේ ප්‍රධාන අංගයක් නොවන්නේ,

(1) ආර්ථික ගෝලීයකරණය (2) සංස්කෘතික ගෝලීයකරණය

(3) සමාජීය ගෝලීයකරණය (4) දේශපාලන ගෝලීයකරණය

(5) තාක්ෂණික ගෝලීයකරණය (......)

37. ලෝකයේ ප්‍රධාන බහු ජාතික සමාගම් අතරින් KFC සහ Unilever සමාගම්වල මව්රටවල් පිළිවෙළින් සඳහන් වරණය මින් කුමක්ද,

(1) ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය

(2) ඇමරිකා එක්සත් ජනපදය, ජපානය

(3) ජපානය, එක්සත් රාජධානිය

(4) එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය

(5) ජපානය, එක්සත් රාජධානිය (......)

38. අග්නිදිග ආසියානු සංගමයට අයත් රටවල් පමණක් දැක්වෙන වරණය වන්නේ,

(1) ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපීනය, සිංගප්පූරුව

(2) ඉන්දුනීසියාව, මැලේසියාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව

(3) ඉන්දුනීසියාව, මැලේසියාව, තායිලන්තය, මාලදිවයින

(4) ඉන්දුනීසියාව, මැලේසියාව, චීනය, දකුණු කොරියාව

(5) ඉන්දුනීසියාව, මැලේසියාව, නේපාලය, මාලදිවයින (......)

39. දකුණු ආසියානු සහයෝගීතා පාරිසරික වැඩසටහන යටතේ බලශක්ති, වගකීම් හා පාරිසරික ගුණය යන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගන්නා රට කුමක්ද?

(1) ඉන්දියාව (2) ඉරානය (3) පාකිස්ථානය

(4) නේපාලය (5) බංගලාදේශය (......)

40. දකුණු ආසියානු රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉහළ මානුෂ සංවර්ධන දර්ශක අගයක් හිමිකර ගෙන තිබේ. ඊට ප්‍රධාන හේතුව වන්නේ,

(1) ආනයන - අපනයන ආර්ථික ක්‍රමයක් ඉදිරිපත් කිරීම ය.

(2) රට තුළ ජනපද යෝජනා ක්‍රම පිහිටුවීමයි.

(3) රජය විසින් ක්‍රියාත්මක කළ සුභසාධක සංවර්ධන ප්‍රතිපත්තීන් ය.

(4) රටේ පරිපාලන ක්‍රමය විමධ්‍යගත වීම ය.

(5) රජය විසින් ක්‍රියාත්මක කළ ජනගහන ප්‍රතිපත්තී න්ය. (......)